## කොටස්වල එකතුවක් වූ පද්ධතිය

කතෝලික චින්තනය ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය විසින් පරාජය කෙරුණ ද මාක්ස්වාදය හා ෆැසිස්ට්වාදය ඔස්සේ ඒ නැවත ඉතිහාසයේ වේදිකාවට පැමිණීමට උත්සාහ ගත් බවත් එහෙත් සුළු කලෙකින් නැවතත් පරාජය වූ බවත් අපි දුටුවෙමු. ඉන් පසුව දකුණු ඇමරිකානු රටවල වරින් වර රටින් රට මාක්ස්වාදී ම නොවුණ ද යම් සමාජවාදයක් කළ එළි බැස ඇමරිකාව විසින් ඒ සෘජුව හෝ වක්‍රව හෝ පරාජය කෙරී ඇති බවත් සඳහන් කෙළෙමු. දකුණු ඇමරිකානු රටවල් ආගමින් කතෝලික බව අප අමතක නොකළ යුතු ය. ඒ අතර දකුණු කොරියාව මෑතක දී ක්‍රිස්තියානි කරවීමට පෙර ආසියාවේ තිබූ එකම ක්‍රිස්තියානි රට වූ පිලිපීනය කතෝලික වුව ද කිසියම් වූ සමාජවාදයක් ඇතිකිරීමට උත්සාහ නොගෙන ඇති බව ද පිළිගත යුතු ය. එමෙන් ම ආගමින් කතෝලික රටක් වූ කියුබාව දැන් අවුරුදු පනහකට වැඩි කාලයක් සමාජවාදී ක්‍රමයක් අනුගමනය කරයි. අප මේ සියල්ල අවම පරස්පර සහිතව තේරුම් ගන්නේ කෙසේ ද?

අප කිහිප වතාවක් සඳහන් කර ඇති පරිදි කතෝලික චින්තනය හා කතෝලික ආගම අතර සම්බන්ධයක් වෙයි. ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි මෙන් නොව කතෝලික චින්තනයෙහි පෞද්ගලිකත්වය වෙනුවට සාමූහිකත්වය රජයයි. චතුස්කෝටිකයක් නැති බටහිර චින්තනයෙහි පෞද්ගලිකත්වයත් සාමූහිකත්වයත් යන දෙකෙන් එකක්වත් අනෙක පාගාදමමින් රජයන්නේ නැති අවස්ථාවක් නැත. චින්තන විප්ලවයකින් පසු කතෝලික චින්තනයෙන් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට හැරුණු යුරෝපයේ පෞද්ගලිකත්වය රජයමින් මිනිසුන් එකිනෙකාගෙන් ඈත්කරමින් පැවති ක්‍රමයට යුරෝපයෙන් විකල්පයක් සෙවීමට තිබුණේ කතෝලික චින්තනය ඇසුරෙන් පමණකි. මාක්ස් හා හිට්ලර් ජර්මනියෙන් (අඩුම තරමින් ජර්මන් සංස්කෘතියෙහි) බිහිවීම පුදුමයක් නො වේ. ජර්මන් සංස්කෘතිය කතෝලික චින්තනය මත පදනම් වෙයි. එමෙන් ම යුරෝපයේ අනෙක් ෆැසිස්ට්වාදියා වූ මුසොලිනී බිහිකල ඉතාලිය ද කතෝලික රටකි. අප කලින් සඳහන් කර ඇති පරිදි කතෝලික චින්තනයෙහි පෞද්ගලිකත්වය සාමූහිකත්වයෙහි ගිල්වෙයි. එසේ වුවත් පෞද්ගලිකත්වයට එරෙහිව යුරෝපීයයනට තිබූ එකම විකල්පය වූයේ කතෝලික චින්තනය ය.

එහෙත් දකුණු යුරෝපය පළමුවත් පසුව යුරෝපයේ සෙසු රටවලුත් කැරලි ගැසුවේ කතෝලික චින්තනයෙහි පෞද්ගලිකත්වය සාමූහිකත්වය තුළ ගිල්ලවීමට ද විරුද්ධව ය. දේශපාලනයෙහි දී ඒ යුරෝපීය වැඩවසම් ක්‍රමයට විරුද්ධව කරන ලද අරගලයක් විය. පාප් වහන්සේගේ හා යුරෝපීය වැඩවසම් රජවරුන්ගේ ඒකාධිපතිවාදය ක්‍රමයෙන් ජනතාවට එපාවෙමින් තිබුණි. එහෙත් ඒ දේශපාලන අරගලය කිරීමට දහඅටවැනි සියවස වන තෙක් බලා සිටීමට යුරෝපීයයනට සිදු විය. පහළොස්වැනි සියවස අවසානය වන විට ඒ විරෝධය චිත්‍ර ශිල්පීන් හා මූර්ති ශිල්පීන් ඔස්සේ කරළියට පැමිණියේ ය. එංගලන්තයේ අටවැනි හෙන්රි රජු ඔස්සේ 1509 න් පසුව පාප් වහන්සේට විරුද්ධව කරන ලද අරගලය එහි තවත් වැදගත් සන්ධිස්ථානයක් විය. මාටින් ලූතර් ඔස්සේ 1517 දී කෙරුණේ අරගලයට අවශ්‍ය ආගමික මතවාදය සංවිධානය වීම ය. ඒ මතවාදය කතෝලික ආගමෙන් හා පාප් වහන්සේගෙන් වෙන් වූ වෙනත් ආගමක් ලෙස මතුවිය. පාප් වහන්සේගේ හෝ ඔහුගේ නියෝජිත පූජකවරයාගේ හෝ මෙහෙයවීමෙන් සාමූහිකව දෙවියන් වහන්සේට යාඥා කරනු වෙනුවට පෞද්ගලිකව අවශ්‍ය නම් නිවසේ දී ම දෙවියන් වහන්සේ සමග සම්බන්ධවීමට ඉන් පසු හැකිවිය.

කතෝලික පූජකවරයකු වීමට ඉතාලියට පැමිණි කොපර්නිකස් භාරතීයයන්ගේ සූර්ය කේන්ද්‍රවාදය බටහිර යුරෝපයට හඳුන්වා දුන්නේ ය. ඒ සමග ග්‍රීකයන්ගේ වියුක්ත චින්තනය නැවතත් යුරෝපීයයන්ට ප්‍රයෝජනවත් විය. ඉන් කලකට පසුව ඉතාලියේ ගැලීලියෝ ගැලීලි කලාවෙන් විද්‍යාවට විශේෂයෙන් ම භෞතික විද්‍යාවට නව චින්තනය ගෙන ආවේ ය. වියුක්ත චින්තනය ද එහි කොටසක් විය. ප්‍රක්ෂේප කරන ලද අංශුවක චලිතය විශ්ලේෂණය කර එකිනෙකින් ස්වායත්තව සිදුකෙරෙන සිරස් හා තිරස් (සංරචක) චලිත දෙකකට වෙන්කර ඒ අධ්‍යයනය කිරීමට ඔහු කියා දුන්නේ ය. අදත් ලංකාවේ උසස් පෙළ පරීක්ෂණයෙහි සංයුක්ත ගණිතය ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රක්ෂිප්ත ගැටළුව ඉගැන්වෙන්නේ මේ වෙන්කිරීම ශිෂ්‍යයන්ට කියා දීමට ය.

අප වියුක්ත චින්තනයෙහි එතරම් දක්ෂයන් නොවීම නිසා අප ඒ පහත්කොට සැලකිය යුතු නො වේ. ඊනියා ඉන්ද්‍රිය ගෝචර සංයුක්ත දැනුම ද මිනිසාගේ නිර්මාණයක් බව අප අමතක නොකළ යුතු ය. බටහිර ගණිතය බටහිර විද්‍යාවට

© Prof. Nalin De Silva

වඩා වියුක්ත ය. ඒ බටහිර ගණිතඥයන් සිතන ආකාරය පමණක් නො වේ. වියුක්ත සරල රේඛාව නොමැතිව බටහිර ජ්‍යාමිතියක් නොමැත. ජ්‍යාමිතිය නොමැතිව බටහිර ගතිකයක් (dynamics) නොමැත. බටහිර ගතිකය නොමැතිව අනෙක් බටහිර විද්‍යා හෝ බටහිර ඉංජිනේරු විද්‍යාව හෝ නැත. වියුක්ත චින්තනය නොමැතිව සාධාරණය කළ හැකි (generalize) නොවේ.

අප කළ යුත්තේ බටහිර ගණිතඥයන් බටහිර ගණිතය වියුක්ත බව පවසන්නේ යැයි කියමින් ඔවුන් හෙළා දැකීම නොව වියුක්තය හොඳින් ඉගෙන සංයුක්තය හා වියුක්තය අතර මනා තුලනයක් ඇතිකර ගැනීම ය. බටහිර ගණිතයේ සහ බටහිර චින්තනයේ බොහෝ විරුද්ධාභාස හෙවත් පරස්පර ඇත. සීනෝගේ විරුද්ධාභාසය හා රසල්ගේ විරුද්ධාභාසය ආදිය මෙයින් ප්‍රධාන ය. මේ විරුද්ධාභාස ඇතිවන්නේ ඊනියා සංයුක්ත ඉන්ද්‍රිය ගෝචර ලෝකයකින් පැනගිය වියුක්ත චින්තනයක් නිසා නො වේ. ඒ විරුද්ධාභාසවලට ප්‍රධාන හේතුව ඇරිස්ටෝටලීය න්‍යායෙහි ඇති දුර්වල කම ය. පරස්පර ඇත්තේ න්‍යායක් (logic) හේතුකොටගෙන මිස වියුක්තයක් නිසා නොවේ.

ඇරිස්ටෝටලීය ගතිකයෙන් වෙනත් ගතිකයකට මුල පිරූ ගැලීලියෝ ගැලීලි 1642 දී මියගිය අතර ඒ වසරේදීම අයිසැක් නිව්ටන් ඉපදුණේ ය. නිව්ටන් නව චින්තනය ඉදිරියට ම ගෙන ගියේ ය. සූර්යාලෝකය දේදුනු පාටවලට වෙන්කරන ආකාරය ඔහු ඉගැන්වී ය. කලනය පිළිබඳ මූලික දැනුම ඔහුට භාරතයෙන් ලැබුණ ද, ඔහු ඒ දැනුම නව චින්තනය පදනම් කර ගනිමින් වර්ධනය කිරීමට උත්සාහ ගත්තේ ය. එහෙත් එය යම් පමණකින් වුවත් සාර්ථකව ඉටුකිරීමට දහනවවැනි සියවස වන තෙක් බලා සිටීමට බටහිර ගණිතයට සිදුවිය. සීමාව පිළිබඳ ව දහනවවැනි සියවසේ ගණිතඥයන් විසින් කරන ලද වර්ධන ඒ සාර්ථකත්වයට හේතුවිය. එහෙත් තවමත් එහි අඩුපාඩු තිබේ. ඒ පිළිබඳ නිසි අධ්‍යයනයකින් තොරව ඒ අඩුපාඩුකම් ගැන කතාකිරීම නුසුදුසු ය. එහි ද අඩුපාඩුවලට හේතුව න්‍යාය මිස වියුක්තය නො වේ.

මේ අතර නව ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය ඔස්සේ ඊනියා කාර්මික විප්ලවය ද, ධනපති විප්ලවය ද, ප්‍රංශ විප්ලවය ද සිදුවිණි. කාර්මික විප්ලවයේ පදනමේ ඇත්තේ ම පද්ධතියක් කොටස්වලට කැඩීමට හැකිබව හා ඒ කොටස් එකිනෙකින් ස්වායත්ත ව ක්‍රියා කරන්නේ යැයි උපකල්පනය කිරීම ය. මෝටර රථයක් කොටස්වලට කඩන්නේත් ඒ එක් එක් කොටස ක්‍රියා විරහිත වූ විට හෝ එහි යම් අඩුවක් සිදුවූ විට හෝ ඒ වෙනුවට එවැනි ම වූ වෙනත් කොටසක් සවිකරන්නේත් පද්ධතියක් එකිනෙකින් ස්වායත්ත වූ කොටස්වලට කැඩිය හැකි ය යන පදනම මත ය. අද බටහිරයන් ශරීරයේ කොටස් ඉවත්කර ඒ සමාන කොටස් බද්ධ කරන්නේ ශරීරය පද්ධතියක් ලෙස නොව කොටස්වල එකතුවක් ලෙස සලකමිනි. ඒ නිව්ටෝනිය යාන්ත්‍රිකය, එනම් ඒ චින්තනය, බටහිර වෛද්‍ය විද්‍යාවේ යොදාගැනෙන ආකාරය ය.

විශේෂයෙන් ම නිව්ටන්ගෙන් පසුව බටහිර විද්‍යාඥයෝ තමන් කරන්නේ පවත්නා යථාර්ථයක්, එනම් දෙවියන් වහන්සේගේ මැවීමක්, තේරුම් ගැනීමක් බව සිතති. නිව්ටන් ඒ බව ප්‍රසිද්ධියේ ම කියා ඇත. එහෙත් එයට පෙර කොපර්නිකස් ද එවැනි ආකල්පයක් ඇතිව සිටියාට සැකයක් තිබිය හැකි නො වේ. කොපර්නිකස් මෙන් ම ගැලීලියෝ ද ආගමින් කතෝලික වූහ. කතෝලික ලෝකය සංයුක්ත විය. එහෙත් කොපර්නිකස්ගේ හා ගැලීලියෝගේ ලෝකය වියුක්ත විය. අපේ ඉන්ද්‍රියවලට ගෝචර නොවුව ද ග්‍රහ වස්තු සූර්යයා වටා ගමන්කරන බව කොපර්නිකස් වියුක්තව වුව ද විශ්වාස කරන්නට ඇත්තේ දෙවියන් වහන්සේ ලෝකය එලෙස නිර්මාණය කර තිබෙන බව ඔහු ඇදහූ නිසා විය යුතු ය. පසු කලෙක අයින්ස්ටයින් මහත් ගර්වයෙන් හා ආත්ම විශ්වාසයෙන් කී කතාවක් මෙහි දී සඳහන් කළ යුතු ය. සූර්යග්‍රහණයක දී ආලෝකයේ නැමීම (bending of light) මැනගත් විද්‍යාඥයන්ට මුල දී ලැබුණේ අයින්ස්ටයින් තම ප්‍රවාදයෙන් ගණනය කර තිබූ අගයෙන් හරි අඩක් පමණ ය. අයින්ස්ටයින් එහි දී කියා ඇත්තේ විද්‍යාඥයන් මැනගත් අගය වැරදි බවත් දෙවියන් වහන්සේ ලෝකය මවා ඇත්තේ තමාගේ ප්‍රවාදයට අනුව බවත් ය!

බටහිර විද්‍යාවේ ඊනියා යථාර්ථය, ඒ තේරුම් ගැනීමට බටහිර විද්‍යාඥයන් කරන උත්සාහය ආදිය අත්හැර දැමූ විගස අපට අපේ විද්‍යාවක් නො ලැබෙයි. අපේ විද්‍යාව වියුක්තියට පරිභව කිරීමෙන් හෝ විරුද්ධාභාසවලට වැරදි තේරුම් දීමෙන් හෝ නො ලැබෙයි. අපේ විද්‍යාවක් ලබාගැනීම එතරම් සරල කටයුත්තක් නො වේ. එහි දී අප සිංහල බෞද්ධ චින්තනය, එහි න්‍යාය ආදිය හැදෑරිය යුතු ය. එමෙන් ම අප බටහිර නිර්මාණය වී ඇති දැනුම අපේ චින්තනයට

© Prof. Nalin De Silva

අවශෝෂණය කරන්නේ කෙසේ ද යන්න ද සලකා බැලිය යුතු ය. ඒ අතර අපේ චින්තනය පදනම් කරමින් අපේ ප්‍රවාද නිර්මාණය කළ යුතු ය.

ධනපති විප්ලවයෙන් සමාජය පරමාණුකරණය විය. එනම් මිනිසුන් තව තවත් එකිනෙකාගෙන් ස්වායත්ත වී දැවැන්ත යන්ත්‍රයක දැති රෝද පමණක් බවට පත්විය. කර්මාන්ත ශාලා යනු මිනිස් පරමාණු එකට වැඩකරන තැනක් මිස සාමූහිකත්වයක් ඇති තැනක් නො වී ය. එහි කම්කරු සහෝදරත්වයක් නො වී ය. එතැන ඊනියා කම්කරු සහෝදරත්වයක් දුටුවෝ කතෝලික චින්තනය මත පදනම් වී සාමූහිකත්වයක් ගැන කතාකළ මාක්ස්වාදීහු ය. ප්‍රංශ විප්ලවයෙන් පුද්ගලයා සමස්තයෙන් හෙවත් සමාජයෙන් ස්වාධීන කෙරිණි. ඊනියා නිදහස, සමානත්වය වැනි සංකල්ප පැනනැගුණේත් මානව අයිතිවාසිකම් හා මූලික අයිතිවාසිකම් පිළිබඳ සංකල්ප ඇතිවූයේත් පුද්ගලයා තව තවත් සමාජයෙන් හා රජයෙන් වෙන් කරමිනි. මානව අයිතිවාසිකම් හා මූලික අයිතිවාසිකම් ප්‍රධාන වශයෙන් ම පුද්ගලයා රාජ්‍යයෙන් ලබාගන්නා නිදහස සමග බැඳී ඇත.

අද ඇමරිකාවේ මේ වෙන්කිරීම තව දුරටත් කෙරීගෙන යයි. එහි ලිබරල් පක්ෂයට අවශ්‍ය වන්නේ ආණ්ඩුවේ බලපෑම තව තවත් හීන කිරීමට ය. බදු අඩුකිරීම ඊනියා වෙළෙඳ පොළ බාධකවලින් තොරව පවත්වාගෙන යෑම ආදිය රාජ්‍යය හා ජනතාව වෙන්කිරීම, එනම් පුද්ගලයා හැකිතාක් සමාජයෙන් වෙන්කිරීම මත පදනම් වෙයි. එහෙත් වෙළෙඳ පොළට එසේ ස්වාධීනත්වයක් ලබාදුන් විට, උදාහරණයක් ලෙස පුද්ගලයන්ට තම අවශ්‍යතා පරිදි බැංකු සමග කටයුතුකිරීමට ඉඩදුන් විට සිදුවන්නේ කුමක් ද යන්න දැන් බටහිර ලෝකයේ පවතින අවපාතයෙන් ම තේරුම් ගත හැකි ය. වත්මන් අවපාතයෙන් ගැලවීමට යම්තමින් වුවත් හැකියාවක් ලැබෙන්නේ තව තවත් රාජ්‍යය ආර්ථිකයෙන් ඉවත්වීමෙන් නොවන බව අද වන විට පැහැදිලි වී ඇත. අද බැංකු මුදාගැනීමට අකමැත්තෙන් වුව ද මැදිහත්වීමට රාජ්‍යයට සිදු වී ඇත. ලිබරල් පක්ෂය දිගට ම බලයේ සිටියේ නම් ඇමරිකාවේ ආර්ථික අර්බුදය තවත් උග්‍රවීමට නියමිත ව තිබුණි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva